# 2023 පෙබරවාරි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2023 පෙබරවාරි මස මාසික සභා රැස්වීම 2023.02.09 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

### නිලධාරී සහභාගීත්වය

1. ප්‍රධාන සංවර්ධන නිලධාරී - කේ.පී.ජී.පී.කුමාරසිංහ මිය
2. කළමනාකරණ සේවා නිලධාරී - පී.කේ.ඩී.සී.කුමාරි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### I.පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2023.01.12 වන දින මාසික සභා රැස්වීස් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 2.ගරු සභාපතිතුමාගේ නිවේදන

#### 2.1. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

- ර්.ආර්.පොඩිමැණිකේ නමින් ඇති අංක LW-156 දරණ ජල බිල්පත පී.කේ. ලක්මාලි සුගන්ධිකා නමින් සංශෝධනය වන බව සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

- ඩී සිරිපාල නමින් ඇති අංක UD-375 දරණ ජල බිල්පත ඒ.ඒ.ඩී.නාලනී ප්‍රියංකා නමින් සංශෝධනය වන බව සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## 3.සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම.

### 3.1 නිවාඩු අනුමත කර ගැනීම.

ගරු උප සභාපති ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්. අබේවික්‍රම මැතිතුමිය,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ ගුණතිලක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්, නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

## 4.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5.කල් දී ඇති යෝජනා

### 5.1 ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදි.

I. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් කර්මාන්ත සඳහා බිල්පත් ගෙවීමට සභා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | | මිල විචලනය | එකතුව |
|---|---|---|---|---|
| 01 | පූර්ව ළමාවිය සංවර්ධනය හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම | 1,812,314.24 | 622,423.08 | 2,434,737.32 |
| 02 | ඕපනායක හෙළ බොජුන්හල ඉදි කිරීම හා වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම. | 6,749,937.48 | 443,487.61 | 7,193,425.09 |
| 03 | වැලිගෙපොල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉහල මහල ඉදි කිරීම. | - | 641,171.42 | 641,171.42 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.එච් සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා, මේ සඳහා ප්‍රතිපාදන ලැබී ඇත්ද යන්න විමසුවේය.

ඊට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, පසුගිය වර්ෂයේ සිදු කරන ලද මෙම කර්මාන්ත සඳහා ප්‍රතිපාදන ලැබී ඇති බවත් එම බිල්පත් ගෙවීම සඳහා සභා අනුමැතිය අවශ්‍ය බවත් ප්‍රකාශ කළේය.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

II. 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවසභා සම්මත කිරීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සහා සම්මත විය.

III. පහත පරිදි 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ වෙන්දේසි මණ්ඩලය පත් කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

- ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා
- කාර්මික නිලධාරී
- ප්‍රධාන සංවර්ධන නිලධාරී
- ගිණුම් විෂය නිලධාරී
- විෂය නිලධාරී
- විමර්ෂණ නිලධාරී (අධීක්ෂණය සඳහා)
- ප්‍රජා සංවර්ධන නිලධාරී (අධීක්ෂණය සඳහා)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සහා සම්මත විය.

IV. පහත පරිදි 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ අපහරණ මණ්ඩලය පත් කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සී.ප්‍රේමකුමාර මැතිතුමා
- කාර්මික නිලධාරී
- ප්‍රධාන සංවර්ධන නිලධාරී
- ගිණුම් විෂය නිලධාරී
- විෂය නිලධාරී
- විමර්ෂණ නිලධාරී (අධීක්ෂණය සඳහා)
- ප්‍රජා සංවර්ධන නිලධාරී (අධීක්ෂණය සඳහා)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සහා සම්මත විය.

V. ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම් ගත කිරීමේ වැඩ සටහන සඳහා සහභාගී වන බහු කාර්ය හා දෛනික වැටුප් ලබන සේවකයන් හට දීමනාවක් ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධ විවිධ අදහස් දැරීම හේතුවෙන් එකඟතාවයකට පත් නොවන ලදි.

VI. සඳගනාගම සිට දෙනිහේන දක්වා දිවෙන මාර්ගය ''පූජ්‍ය කෝන්ස්තැන්නේ විජයවංශ නා හිමි'' මාවත වශයෙන් නම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතුතිමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සහා සම්මත විය.

VII. ඕපනායක හෙල බොජුන්හල අසල දුම්රිය මැදිරියක් ස්ථාපනය කිරීම සඳහා එම දුම්රිය මැදිරිය රැගෙන ඒමට යන වියදම අනුමත කර ගැනීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධව ද එකඟතාවයකට පත් නොවන ලදි.

VIII. සභා කාර්යාලයේ රැස්වීම් ශාලාවට පිවිසෙන ප්‍රධාන පඩිපෙළ සැකසීම සඳහා වියදම් දැරීම අනුමත කර ගැනීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදි.

මෙම යෝජනාව ද විවිධ අදහස් දැරීම හේතුවෙන් එකඟතාවයකට පත් නොවන ලදි.

IX. අක්කර බදු සත්‍යෙක්ෂණ වාර්තාව හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම අනුමත කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

X. රු:50,000.00 ඉක්මවන වාහන අළුත්වැඩියා සහ සේවා කිරීම සඳහා වන බිල්පත් සභාවේ/ මුදල් කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව වියදම් ගෙවීමට ගරු සභාපතිවරයාට බලය පැවරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XI. සභාවේ රු:500,000.00 සීමාව ඉක්මවන වියදම් සඳහා ප්‍රසම්පාදන කමිටුව ලෙස සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් පත් කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XII. පහත පරිදි සෞඛ්‍ය කමිටුව,පුස්තකාල උපදේශණ කමිටුව,කර්මාන්ත කමිටුව,නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව,කාර්මික සේවා කමිටුව සහ පරිසරය හා පහසුකම් කමිටුව යන කමිටු පත්කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

<u>සෞඛ්‍ය කමිටුව</u>

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය.
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා.

<u>පුස්තකාල උපදේශණ කමිටුව</u>

- විහාරාධිපති, තැන්නයායේ සුමංගල හිමි,අකරල්ල ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය
- සභාපති,කේ.ඕ.කේ.ප්‍රියංකර ජයසිංහ මැතිතුමා,වැලිගෙපොල ප්‍රාදේශීය සභාව
- ලේකම්,එස්.එච්.ඒ.කරුණාරත්න මිය ,වැලිගෙපොල ප්‍රාදේශීය සභාව
- විශ්‍රාමික විදුහල්පති,ඩී.කේ.චන්ද්‍රසේන මහතා
- විශ්‍රාමික ප්‍රාදේශීය සභා ලේකම්,කේ.එම්.සෝමාවතී මහත්මිය
- විශ්‍රාමික උප ගුරු,ඥාණසීලී ලියනපතිරණ මෙනෙවිය
- උප ගුරු එන්.කාලිංගදේවී මහත්මිය,ර/හල්ලින්න දෙමළ විද්‍යාලය
- විශ්‍රාමික චිත්‍ර ගුරු උපදේශක එන්.කේ.තානායම්වත්ත මහතා
- කෘෂිකර්ම ව්‍යාපෘති නිලධාරි ඩී.ජී.විමලසේන මහතා
- උප ප්‍රධානාචාර්ය,ජේ.චන්ද්‍රා ධර්මශීලි මහත්මිය,සිරි විජය දහම් පාසල
- සමෘ මණ්ඩල සමෘ කාරක හා දහම් පාසල් ආචාර්ය ඩබ්.ඒ.අයිරාංගනී හේමලතා මහත්මිය
- මච්ඡිම මාධ්‍යවේදිනි මාලා එදිරිසිංහ මහත්මිය

- ප්‍රාදේශීය රෝහල් සෞඛ්‍ය සේවා නිලධාරී ජේ.ඒ.හේමා චන්ද්‍රලතා මැණිකේ
- උප ගුරු ධනුෂ්ක ප්‍රියනාත් මහතා,ර/අකරැල්ල විද්‍යාලය
- සිරි විජය වැඩිහිටි සමිති සභාපති බුද්ධදාස ගන්ගොඩ ආරච්චි මහතා
- පූර්ව ළමාවිය සංවර්ධන නිලධාරී ජී.එච්.විජේසුන්දර මිය
- මැහුම් උපදේශිකා රුක්මණී අශෝකමාලා සෙල්ලප්පෙරුම මහත්මිය
- එස්.සුදරුශනී මහත්මිය,ර/හුණුවල දෙමළ විද්‍යාලය
- උප ගුරු මානෙල් චන්ද්‍රලතා,ර/ධර්මරාජ මහා විද්‍යාලය
- උප ගුරු පී.එච්.ඒ.ටී.එම්.සෝමසිරි,ර/ගල්කන්ද විද්‍යාලය
- පුස්තකාලායාධිපති,කේ.කේ.නන්දානිකා මහතිමිය(ව්‍යාපෘති කමිටු ලේකම්)

<u>**කර්මාන්ත කමිටුව**</u>

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

<u>**පරිසර හා පහසුකම් කමිටුව**</u>

- ගරු උප සභාපති ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
- ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා

<u>**නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව**</u>

- ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා

<u>**කාර්මික සේවා කමිටුව**</u>

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.එබ්.සුමණාවතී මැතිතුමිය
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XIII. උඩවෙල වැහින්තැන්න මාර්ගයට අදාල ඉඩම් කොටස රජයට අත්පත් කර ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, 1961.06.16 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති දිග සැතපුම් 02 හා දම්වැල් 40 න් යුත් පළල අඩි 16 වන මාර්ගය සහ රත්නපුර-බලංගොඩ ප්‍රධාන මාර්ගයේ සිට උඩවෙල වෙලට ප්‍රවේශ වන මාර්ගය යනු උඩවෙල වැහින්තැන්න මාර්ගයමද යන්න තහවුරු කළ නොහැකි බැවින් එය නිරවුල්ව අදාල ගම් වාසීන් වෙත පරිභෝජනය කළ හැකි වන පරිදි ලබා දීමට

මාර්ගයට අදාල ඉඩම් කොටස රජයට අත්කර ගැනීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර අනුමත කර ගැනීමට අවයශ්‍ය බව පවසා සිටියේය.
ඒ අනුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XIV. කාර්යාලීය රැස්වීම් ශාලාවට අවශ්‍ය පුටු 500 මිලට ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධ විවිධ අදහස් දැරීම හේතුවෙන් එකඟතාවයකට පත් නොවන ලදි.

XV. රැස්වීම් ශාලා පුටු ලබා ගැනීම සඳහා අවශය වන මුදල පියවා ගැනීම සඳහා මුද්දර ගාස්තුවලින් අයකර ගැනීමේ පදනම මත සබරගමුව පළාත් සභාව මඟින් ලබා දෙනු ලබන ණය මුදලක් ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධව විවිධ අදහස් දැරීම හේතුවෙන් එකඟතාවයකට පත් නොවන ලදි.

XVI. ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි නීතිඥ ලෙස ප්‍රභාත් හර්ෂණ මහතා පත් කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා, මෙම නිතීඥවරයා තෝරා ගන්නේ කෙසේදැයි සහ ගෙවීම පිළිබඳ විමසුවේය.

ඊට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, පළාත් පාලන විෂය සම්බන්ධ දැනුම ඇති නීතිඥවරයකු පත් කර ගන්නා අතර නඩුවකට පෙනී සිටිය හොත් පමණක් රු:500.00 ක් 1000.00 ක ගෙවීමක් සිදු කරන බව ප්‍රකාශ කළේය.
ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XVII. ජාතික තරුණ සේවා සභාවේ තොරතුරු තාක්ෂණ සංනිවේදන ශිල්පී (NVQ 4) පාඨමාලාව සාර්ථකව නිම කරන ලද කිරඹ, ඔපනායක ලිපිනයෙහි පදිංචි ඊ.ඩබ්.ගවේෂිකා ශෂිනි කරුණාරත්න මෙනෙවියට ගෙවීම් රහිතව මාස 06 ක කාලසීමාවක් සඳහා පුහුණු අවස්ථාවක් ලබා දීමට සහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.උපුල් වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XVIII. ගලි ප්‍රතිකාරක මධ්‍යස්ථානයේ යන්ත්‍ර ක්‍රියා කිරීමට හා නඩත්තු කටයුතු සඳහා කේ.පී.මධුරංග දිල්ශාන් මහතාගේ සේවය මාස 06 ක් සඳහා මිලදී ගැනීම.

ඒ අනුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්. සුමනාවති මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XIX. 2023.02.17 පැවැත්වීමට නියමිත ගී සැඳැව සඳහා විනෝද බදු රහිතව රැස්වීම් ශාලාව ලබාදීම.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච් සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
එහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ රෝහණ විජේරත්න මැතිතුමා, විනෝද බද්ද පිළිබඳව සභාවට ඉදිරිපත් කර අනුමැතිය ගැනීමට යෝජනාවක් කළද එය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවට කරුණු ඉදිරිපත් කළේය.

තවද මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ. වසන්ත කුමාර මැතිතුමා, මෙහි විනෝද බද්ද නිදහස් කළද සභා ගොඩනැගිල්ලට අදාළ ගාස්තුව ලැබේද යන්න විමසුවේය. තවද සභාවට ලබාගත හැකි ආදායම් මගහරවා නොගෙන කටයුතු කිරීම අවශ්‍ය බවද වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

ඊට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, මෙම ගොඩනැගිල්ල කුලියට දීමට අවශ්‍ය සියළු පහසුකම් එනම්, ශාලාවට අවශ්‍යය පුට,තිර, විදුලිය ආදී සියල්ල සම්පූර්ණ කළ පසු විනෝද බද්ද ද අය කරගෙන නිසි ආදායමක් ලබා ගත හැකි බව ප්‍රකාශ කළේය.

පසුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XX. යටිපස්ගමුවේ පාර අඩි 10 ක් දක්වා පළල් කර ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී ශ්‍රීමාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදි අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, මෙම මාර්ගය සම්බන්ධව කාර්මික නිලධාරීන් සම්බන්ධ කර ගෙන ස්ථාන පරීක්ෂාවක් සිදු කළ අතර එම පාර පළල අඩි 3 ක් පමණ වන බවත්, වාහනයක් යෑම සඳහා එය ප්‍රමානවත් නොවන බැවින් යටිපස්ගමුව මාර්ගය ආරම්භයේ සිට අඩි 10 ක් දක්වා පළල් කර ගැනීමට අවශය වන බවත් පැහැදිලි කළේය.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 6.කාරක සභා වාර්තා සලකා බැලීම.

### 6.1.මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

2023.01.20, 2023.01.26, 2023.02.01 හා 2023.02.06 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසිමේ කාරක සභා වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

### 6.2. ප්‍රසම්පාදන වාර්තා

2022.12.12, 2022.12.22, 2022.12.23 හා 2023.02.08 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තා මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7.ආදායම් වියදම් වාර්තා

### 7.1. 2022 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 622,389.11 | වැටුප් හා දීමනා | 4,393,553.76 |
| කුලී | 661,108.01 | ගමන් වියදම් | 43,595.00 |
| බලපත්‍ර ගාස්තු | 56,850.00 | සැපයුම් හා උපකරණ | 1,284,581.50 |
| සේවා සඳහා ගාස්තු | 209,536.95 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,202,908.00 |
| වරෙන්තු ගාස්තු | 298,195.93 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 468,399.95 |
| වෙනත් ආදායම් | 2,513,262.56 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 321,619.97 |

| | | | |
|---|---|---|---|
| වෙනත් ආධාර | 3,893,994.98 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 8,259,337.54 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 55,804.48 |
| මූලධන ලැබීම් | 402,840.33 | පුනරාවර්ථන වියදම් එකතුව | 7,770,462.66 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | 402,840.33 | ප්‍රාග්ධන වැය | 1,683,590.33 |
| පුනරාවර්ථන / ප්‍රාග්ධන ආදායම් එකතුව | 8,662,177.87 | ණය ආපසු ගෙවීම් | 310,810.58 |
| සේවක ණය | 116,814.67 | සේවක ණය | - |
| තැන්පත් | 1,074,128.83 | තැන්පත් | 937,066.58 |
| අත්තිකාරම් | 119,450.00 | ණය හිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | - |
| සමුච්චිත අරමුදල | 10,595.63 | ජල ගබඩා | 96,389.00 |
| | | ගබඩා(ඖෂධ) | 191,005.00 |
| වෙනත් ලැබීම් එකතුව | 1,577,828.13 | සමුච්චිත අරමුදල | 400.00 |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 1,224,860.58 |
| මුළු එකතුව | 10,240,006.00 | මුළු ගෙවීම් | 10,989,724.15 |

## 7.2. 2022 දෙසැම්බර් 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත.

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරින් වෙත යොමුකර ඇති බව,ප්‍රකාශ කරන ලදී.

## 9.වෙනත් කරුණු

### 9.1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය,සඳනාගම සිට දෙනිහේන දක්වා දිවෙන මාර්ගය "පූජ්‍ය කෝන්ගස්තැන්නේ විජයවංශ නා හිමි" මාවත වශයෙන් නම් කිරීමේ යෝජනාව සභාවට ඉදිරිපත් කර අනුමත කර ගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමා හට ස්තූතිවන්ත වන අතර මහ මැතිවරණය සම්බන්ධ තීරණය කුමක් වුවද තම මන්ත්‍රී ධූරය මේ මස පමණක් විය හැකි බවත් එක්සත් ජාතික පක්ෂයෙන් ජන්දය ඉල්ලා මෙතරම් දුරක් පැමිණිය බවද මෙවර සමගි ජන බලවේගයෙන් ජන්දය ඉල්ලීම සම්බන්ධයෙන් නිදහසට කරුණු දක්වන ලෙස හා පක්ෂ සාමාජිකත්වය අහෝසි කර ඇති බව පවසා ලිපියක් එවා ඇති බව හා තමා කැමති පක්ෂයකින් ජන්දය ඉල්ලා සිටීමට තමාට අයිතිය ඇති බවත් මෙම මන්ත්‍රීධූරයෙන් සභාව තුළදී හෝ පිටතදී යම් අයෙකුට සේවාවක් ඉටුකර දීමට හැකි වූවා නම් ඒ ගැන සතුටු වන බවත් ප්‍රකාශ කළාය.

දේශපාලනය කරන විට වැඩිහිටියන් විදියට ආදර්ශමත් විය වුතු බවත්,දේශපාලන පක්ෂවලට ගැරහීමක් සිදු නොකරන බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමිය,තව වසරකින් මැතිවරණය දීර්ඝ කර ජනතා මතයට ඉඩ

නොදී කටයුතු කිරීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන බවත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට ඉඩදිය යුතු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීතුමිය,ඉදිරි මහ මැතිවරණය පැවතියහොත් සියළු දෙනාට ජය ප්‍රාර්ථනා එක් කළාය.

## 9.2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

පළමුව වන අලි ගැටළුව සම්බන්ධව අදාල බලධාරීන් හට ලිපියක් යොමු කිරීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වන අතර නමුත් එම නිලධාරීන් ඒ පිළිබඳව කිසිම වගකීමක් නොමැති බවත් කිසිදු ක්‍රියාමාර්ගයක් ඒ වෙනුවෙන් නොගත් බවටත් කණගාටුවෙන් යුතුව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම රත්නපුර දිස්ත්‍රික්කය සඳහා නව වනජීවී ඇමති ලෙස පවිත්‍රාවන්නිආරච්චි මැතිතුමිය පත් කර ඇති බැවින් පෙර ලිපි යොමු කලද විසඳුමක් නොවූ බව පවසා එතුමිය වෙත නැවතත් මෙම ලිපිය යොමුකරන ලෙස ඉල්ලා සිටියේය.

දේශපාලන පක්ෂය කුමක් වුවද වසර පහක් පුරාවට එක් කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කළ අතර විවේචනයන් මෙන්ම ප්‍රශංසා ඉදිරිපත් කරමින් කටයුතු කළ අතර නව මහ මැතිවරණයක් පැවැත්වීමට සූදානම්ව සිටියදී නව යෝජනා ක්‍රියාත්මක නොකර අලුතින් පත්වන නියෝජිතයන් හට ගැටළුකාරී නොවන අයුරින් වැඩකටයුතු කරගෙන යාමට පසුබිම සකස් කළයුතු බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා,රට ආර්ථික අර්බුධයකට පත්වී ඇති අවස්ථාවක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා නායකත්වය භාර ගෙන කෙටි කාලයක් තුළදී ගෑස් පෝලිම්,තෙල් පෝලිම් නොමැතිව මේ තත්වයට ගොඩනැගීම පිළිබඳව හා එතුමා විසින් මනාප ඉලක්ක කර ගනිමින් නොව ඉදිරි අනාගතය වෙනුවෙන් කටයුතු කරන බවද ප්‍රකාශ කළේය.එමෙන්ම තමාද එක්සත් ජාතික පාක්ෂික අපේක්ෂිතයෙකු ලෙස ඡන්දයට ඉදිරිපත් වන බවත් ජය පරාජය කෙසේ වුවත් රටට යහපතක් වේ නම් තම බලාපොරොත්තුව එය බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි.

තවද ගරු සභාපතිතුමා ප්‍රාදේශීය සභාවක් ලෙස සංවර්ධන කටයුතු රැසක් කළ අතර සභාව ඉහලට ඔසවා තැබීමට සුජාතභාවයෙන් හා සත්භාවයෙන් කටයුතු කිරීම පිළිබඳව සතුටු වන අතර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරි මහ මැතිවරණයේදී සියළු දෙනාහට ජය ප්‍රාර්ථනා කරන ලදි.

## 9.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සී.ප්‍රේමකුමාර මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා,ඉහළ උඩගම ග්‍රාම නාම වෙනස් කිරීම සම්බන්ධව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කලද ඒ පිළිබඳ නිසි පිළිතුරක් නොලැබුන බැවින් එම ජනතාව මහත් පීඩාවට පත් වී ඇති හෙයින් ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කර එම ග්‍රාම නාමය නිවැරදි කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

තවද මහමැතිවරණයක් ඉදිරියේ පැවැත්වුවද දේශපාලන අරමුණින් නොව අවශ්‍යතාවය ප්‍රමුඛව සලකා පොදු ස්ථානවලට අවශ්‍ය විදුලි පහන් ලබා දෙන ලෙස වැඩිදුරටත් ඉල්ලා සිටියේය.

## 9.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි තමරා කුමාරි යටිකිද මැතිතුමිය

දේශපාලනය පිළිබඳ, දේශපාලන පසුබිම පිළිබඳ මහජනතාව තුල පවතින්නේ කළකිරීමක් බවද නමුත් දේශපාලනය ජය ගන්න හැකි වන්නේ එක් එක් පුද්ගලයාගේ පවතින දක්ෂතාවය මත බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමිය, අප සභාවේ මන්ත්‍රීවරියක් දේශපාලන පක්ෂයෙන් සමුගැනීම පිළිබඳව කතා කළ බැවින් දේශපාලන පසුබිම කුමක් වුවත් දේශපාලනයට අවශය විනය,සංයමය.තවකෙනෙක් සමඟ නිහතමානීව කථා කිරීමේ හැකියාව,තවත් කෙනෙක්ට සවන් දීමේ හැකියාව හා නිර්මාණශීලීත්වය එතුමිය තුලින් මා දුටු විශේෂ ගුණාංග බවත් නැවතත් කුමන හෝ පක්ෂයකින් තරඟ කර සභාව තුල එකට අසුන් ගැනීමට හැකිවේවායි ඇයට ප්‍රාර්ථනා කරන බවද ප්‍රකාශ කළාය.

තවද අපි හැම දෙනාගේම උත්සාහය වන්නේ තමා නියෝජනය කරන පරිසරය තුළ අවශ්‍ය සංවර්ධනයන් ඉටු කිරීම හා එහි ජීවත් වන අහිංසක ජනතාවගේ ජීවිතය යම්තාක් දුරට නගා සිටුවීමෙන් ඔවුනට සහනයක් වීම බවද පෙන්වාදුන් ගරු මන්ත්‍රීතුමය, දේශපාලනයේ දී අප නියෝජනය කරන පක්ෂයට වඩා දේශපාලනය පිළිබඳව තිබෙන හැකියාව ,එහිදී ක්‍රියාකරන ආකාරය හා හදවතේ තිබෙන තෙතමනය වඩාත් බලපාන බව ප්‍රකාශ කළාය. එමෙන්ම තවකෙනෙක් පිළිබඳව මැසිවිලි  නගනවාට වඩා තමන්ගේ යුතුකම්, වගකීම් ඉටු කරමින් කටයුතු කිරීම වගේම දේශපාලනයට සුදුසු පුද්ගලයෙක් වීම ඉතා වැදගත් බවත්,මොනයම් හෝ දේශපාලන මතයකින් දේශපාලනයට පැමිණියද තම කොට්ඨාශයේ ජනතාවට සේවයක් කළ හැකි නියෝජිතයකු විය යුතු බවත් වැඩි දුරටත් ගරු මන්ත්‍රීතුමිය විසින් පැහැදිලි කරන ලදි.

පෙර සභා වාරයකදී ලියා පදිංචි සමිතිවලට ජී.අයි බට ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළද එය තවමත් ඉටු නොවුන බවත් ඒ ගැන අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමිය,අප සභාවේ සභාපතිතුමා විශාල මෙහෙයක් ඉටු කරන බැවින් ඒ පිළිබඳව සතුටුවන බවත් වෙනත් සභා හා සැසඳු කළ, වැලිගෙපොල ප්‍රාදේශීය සභාව වඩාත් සහෝදරත්වයෙන් සිටින මන්ත්‍රී මණ්ඩලයක් වීම ගැන ආඩම්බර වන බවත් ප්‍රකාශ කළාය.

## 9.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බුද්ධික වීරසිංහ මැතිතුමා, සභාවේ සේවකයන් යොදවා මාර්ගය දෙපස එළිපෙහෙළි කර දෙන ලෙස ඉල්ලා සිටි අතර මෙවර සභාව තම අවසන සභාවාරය විය හැකි බවත් පක්ෂ සමාජිකත්වය අහෝසි කර නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස ලිපියක් එවා තිබූ බවත් තම හෘදසාක්ෂියට අනුව තම දේශපාලනය කරන බවත් පක්ෂපාට අදාල නොමැති බවත් ජනතාවගේ ප්‍රශ්ණ විසදීම තම අභිප්‍රාය බවද පැවසූ ගරු මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තමා කැමැත්තෙන් බැඳුණු පක්ෂයක් හා කැපවීමෙන් ගොඩනගපු ආණ්ඩුවක් වුවද එයට ප්‍රති උත්තර ලැබී ඇති අතර එය තමා කුඩා නියෝජිතයෙක් වන බැවින් සිදු වුවද  පක්ෂනායකයින්ගේ හැරයාම් වලට එය අදාල නොවූ බව ප්‍රකාශ කළේය.

මෙතැනින් දේශපාලනය අවසන් කිරීමට සිටියද ස්ථිර වශයෙන්ම ලබන නව සභාවට තේරී පත්වන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ,රාජකාරී මට්ටමින් සහ පෞද්ගලිකවත් තමාට උදව් උපකාර කිරීම පිළිබඳ ගරු සභාපතිතුමන්ට ස්තූතිවන්ත වූ අතර නැවත වාරයක් සභාපති තනතුරට පත්වේවායි ප්‍රාර්ථනා කරන නමුදු මෙම ක්‍රමවේදය වෙනස්වීමක් බලාපොරොත්තු වන බව වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

## 9.6 ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රීනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය, මෙය අවසන් සභා වාරය වන බැවින් තම අදහස් ප්‍රකාශ කළ යුතු බවත් කුමන දේශපාලන පක්ෂය නියෝජනය කළද ගරු සභාපතිතුමා අපගේ සිත් රිදවීම් නොකළ අතර අපගේ අදහස්වලට ඇහුම්කන්දී කටයුතු කිරීම පිළිබද ස්තුතිවන්ත වන අතර ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් තම ස්තුතිය පුද කරන බව ප්‍රකශ කළාය. එමෙන්ම ගරු සභාපතිතුමා මෙම කාලය පුරාවට විශාල මෙහෙයක් ඉටු කළ අතර යම් අයෙකු සභාපතිතුමා පිළිබඳව දෝශාරෝපණ නැගූ අවස්ථා වලදී තමා ඒ පිලිබඳව පැහැදිළි කිරීම් කළ බවත් ඕපනායක කොට්ඨාශයට ඉටු කළ හැකි උපරිම සේවය ඉටු කර ඇති බවත් ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීතුමා ඉදිරි නව සභා වාරයේදීත් සභාපතිධුරයේම රැඳීමට හැකි වේවායි සහ සැම දෙනාහටම ජය ප්‍රාර්ථනා කළාය.

## 9.7 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

මන්ත්‍රීවරයෙක් ලෙස දේශපාලනයට සම්බන්ධ වීමට අදහසක් නොතිබුවද මන්ත්‍රීවරයෙක් ලෙස පත් වූ පසු සිටම සභාව මඟින් ගෙන එන ජනතාවාදී යෝජනාවලට එකඟ වූ බවත් ජනතාවගේ බදු මුදල් අවභාවිතාවට විරුද්ධ වූ බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා රට විශාල වශයෙන් ණය වී ඇති බවත් එම මුදල් ගෙවීමට කිසිදු සැලැස්මක් නොමැති පසු බිමක මෙම අර්බුදය විසඳීමට දේපාලන පසුබිමක් සැකසිය යුතු බවත් පෙන්වා දුන්නේය.මැතිවරණය පැවැත්වීමට මුදල් වෙන්වී තිබියදී ජනතාව නොමඟ යවමින් ගෙන යන ප්‍රෝඩාකාරී දේශපාලනය නවත්වා ජනතා මතයට ඉඩ දිය යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

එමෙන්ම විනිවිදභාවයෙන් යුතුව එකඟතාවයට පත් නොවූ යෝජනා ඉවත් කර ගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන අතර ඉදිරි මහ මැතිවරණය සඳහා 25% කාන්තා නියෝජනයක් පැවතීම සතුටට කාරණයක් වන අතර දේශපාලන පක්ෂය කුමක් වුවද කිසි අයකුගේ සිත් නොරිදෙන ලෙස සෑම නියෝජිතයෙකුටම අවස්ථාව ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් වැඩි දුරටත් ඉල්ලා සිටින ලදි.

## 9.8 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, සෑමටම එකසේ ඇහුම්කන් දී ගරු මන්ත්‍රීතුමන් තුමියන්ලාගේ සිත් රිදවීමකින් තොරව කටයුතු කිරීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන අතර ඉදිරි මහ මැතිවරණයේදී සියළු දෙනාට ජය ප්‍රාර්ථනා කළේය.

## 9.9 ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, කුමන දේශපාලන මතවාද පැවතියද ගරු සභාපතිතුමා විසින් මෙම ප්‍රදේශයට විශාල සේවයක් කර ඇති බවද අප මතවාද ඇතිකර ගෙන ජනතාව වෙනුවෙන් නිවැරදි දේ ඉටු කිරීමට උත්සාහ ගත් බවත් පෞද්ගලික අමනාපකම් නොමැති බවද පැවසුවේය.තවද අප නොදැකපු ව්‍යාපෘති මඟින් මෙම ප්‍රදේශයට විශාල මෙහෙයක් ගරු සභාපතිතුමා විසින් ඉටු කර ඇති බව පැවසූ ගරු මන්ත්‍රීතුමා සභා බල ප්‍රදේශ 02 ක් නොමැතිව ඕපනායක බල ප්‍රදේශයට වෙනම සභාවක් පිහිටුවා නම් වඩාත් සුදුසු යැයි පෙන්වා දුන්නේය.

තවද වාර ගණන සීම කිරීම හා මන්ත්‍රීවරුන් සඳහා වරප්‍රසාද සීම කිරීම යන යෝජනා නව සභා වාරයේදී ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා, ඉදිරි මහ මැතිවරණයේදීත් ගරු සභාපතිතුමා හට නැවතත් සභාපතිධුරයම ලැබේවායැයි ප්‍රාර්ථනා එක් කළේය.

**සභා රැස්වීමේ නිමාව.**

වසර 05 ක් පුරාවට ප්‍රාදේශීය සභාවක් ලෙස අප සැවෙම එක් වී කටයුතු කළ අතර ඔබ සියළු දෙනාගේ සහයෝගය මත මෙහි සියළු සංවර්ධනයන් සිදුකළ බවත් පැවසූ ගරු සභාපතිතුමා ,ඉදිරි මහ මැතිවරණය සම්බන්ධ තීරණය කෙසේ වුවද ඉදිරියට කරගෙන යන සියළු වැඩ කටයුතු ඒ ආකාරයෙන් සිදු කරන බවත් පවසමින් දහවල් 12.00 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.